


# බුදු සිරිත අනුව යමු
# අසරණයන්ට සරණ වෙමු

මෙලොව සියල්ලෝ ම සතුටින් ජීවත් වීමට කැමැති වෙති. කරදර, බාධක, අවහිර සිය ජීවිතවලට එළඹෙනු දැකීමට කිසිවෙක් අපේක්ෂා නොකරති. එහෙත් එවැනි අනපේක්ෂිත විපත් අප කරා පැමිණීම කිසිවෙකුටත් වැළැක්විය නොහැකි ය. අපට ස්වභාව ධර්මයට එරෙහි ව යා නොහැකි වීම ඊට හේතුවයි. අපට බාධක, අවහිර හා විපත්වලට මුහුණ දීමට සිදු වන බව අප අවබෝධ කර ගන්නා කල එවැනි විපත්වලට මුහුණ පා සිටින අයට උදවු-උපකාර කිරීමට අපේ සිත් පෙළඹෙනු ඇත. අසරණ වූ අයට කරුණාව දැක්වීම අපේ යුතුකමක් මෙන් ම වගකීමක් ද වේ.

අසරණයින්ට හා ගිලනුන්ට පිහිට වීම සම්බන්ධයෙන් මහඟු ආදර්ශ රැසක් බුදු සිරිත ඇසුරින් අපට උගත හැකි ය. පන්සාළිස් වසක් බුදු සිරිත තුළ උන් වහන්සේගේ මහා කරුණාවට ලක් වී පිහිට ලැබූ පිරිස අපමණ ය. දුකකට කරදරයකට විපතකට පත් වූ විට හෝ එවැන්නකු ගැන දැනගත් විට හෝ ඔහු එම දුකින්, කරදරයෙන්, විපතින් මුදවා ගැනීමට උන් වහන්සේ නොපැකිළ ව ඉදිරිපත් වූ සේක. එහි දී උන් වහන්සේ නෑදෑ හිතවත්කම් ආදී කිසිවක් සැලකිල්ලට නොගත් සේක. උන් වහන්සේ සැලකිල්ලට ගත්තේ පුද්ගලයා පත් වී ඇති අසරණ භාවය පමණි. කරුණාවෙන් සිසිල් වූ හදවතක් උන් වහන්සේට තිබුණි. අලුයම පිබිදී කුලුණුබර හදින් ලොව දෙස බලන උන් වහන්සේගේ බුදු ඇසට ලක් වූ දුක්ඛිතයන් බොහෝ දෙනෙකි. බුදුරජාණන් වහන්සේ එසේ අසරණයින්ට පිහිට වූ අවස්ථා රාශියක් දක්නට ලැබේ. එම අවස්ථා කිහිපයක් කෙටියෙන් විමසා බලමු.

## අසරණ මහලු පියෙක්

සැවැත් නුවර මහ ජනයා එක්රැස් ව සිටි ශාලාවක හදිසියේ නොසන්සුන්කාරී ස්වභාවයක් හට ගැනුණි. කිසි යම් පිරිසක් දොස් පරොස් බස් තෙපළමින් තවත් පිරිසකට පහර දීමට ද සැරසෙන ස්වරූපයක් දක්නට ලැබුණි. පසු ව විමසා බැලීමේ දී පැහැදිලි වූයේ එක ම පවුලේ දරුවන් සිවු දෙනෙකුට එරෙහි ව රැස් ව සිටින්නන්ගේ විරෝධතාව එල්ල වී තිබූ බව ය. විරෝධතාව පිටුපස සියලු දෙනාගේ අවධානයට යොමු විය යුතු වැදගත් සිදුවීමක් තිබුණි. එය අනුවේදනීය පුවතකි.

එක්තරා තරුණ පියෙකුට දරුවෝ සිවු දෙනෙක් සිටියහ. කුඩා කල ඔහු එම දරුවන් සිවු දෙනාට හොඳින් සිප් සතර උගන්වා සුදුසු කල ආවාහ කටයුතු ද සිදු කොට තමා සතු ධනය ද දරුවන්ට සමසේ බෙදා දුන් ගුණගරුක අයෙකි. එහෙත් පසු කලෙක දී එම දරුවන් කළගුණ අමතක කොට සිය පියා රැක බලා ගැනීම උපායශීලී ව ප්‍රතික්ෂේප කළහ. කිසිවෙකුගේ පිහිට නොලබා සැරයටියට පමණක් හිමිකම් කියමින් එම පියා අවසානයේ මහමගට බැස ඉබාගාතේ යමින් සිටිය දී අහඹු ලෙස ජේතවනාරාමයට පැමිණියේ ය. මොහුගේ අසරණ බව මැනැවින් වටහා ගත් බුදුරජාණන් වහන්සේ කෙළෙහි ගුණ නොදත් දරුවන් සිව් දෙනාගේ අකාරුණික භාවය මැනැවින් හෙළි වන ගාථා කිහිපයක් ඔහුට කියා දුන් සේක. අසරණ පියතෙමේ එම ගාථා පාඩම් කොට දරුවන් සිව් දෙනා පැමිණ සිටි ප්‍රසිද්ධ වේදිකාවක ප්‍රකාශ කළේ ය. කෙළෙහි ගුණ අමතක කොට ආත්මාර්ථකාමී හැඟීමෙන් ක්‍රියා කළ දරුවන් සිව් දෙනාගේ සැබෑ තතු දත් මහ ජනතාව ඔවුන් කෙරෙහි සිය අප්‍රසාදය පළ කිරීම ඉහත සඳහන් සිදු වීමට පසුබිම විය. මහජනතාව ඉදිරියේ පියාගෙන් සමාව ගත් දරුවෝ පියා කැඳවාගෙන ගොස් මැනැවින් රැක බලා ගත්හ. අසරණ භාවයට පත් ව සැරයටියේ පිහිට පමණක් ලද පියාට අවසානයේ පිහිට වූයේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ය.

## වරදට හසු වූ නිවැරැදි ගොවියෙක්

දිනක් උදෑසන සිය කුඹුරේ සී සාමින් සිටි ගොවි මහතකු අනපේක්ෂිත පරිදි රාජ පුරුෂයින් විසින් රැගෙන යන්නට යෙදුණි. සොරකමකට වරදකරුවකු ලෙස මෙම ගොවි මහතා හසුවන්නේ තමා නොකළ වරදකට ය. සොර මුළක් පෙර දින රාත්‍රියේ නිවසක් බිඳ පැහැර ගත් වස්තුව අතර තිබුණු මසුරන් දහසක පසුම්බියක්, අතපසු වීමකින් මෙම ස්ථානයේ හැරදමා ගොස් තිබිණි.

රාජ පුරුෂයෝ අහිංසක ගොවියා සොරකම සම්බන්ධයෙන් සැක කර දඬුවම් ලබා දීම පිණිස රැගෙන ගියහ. රාජ පුරුෂයින්ගේ අත්අඩංගුවට පත් ව මර බියෙන් සිටි මෙම ගොවි මහතාට, උදෑසන කුඹුරට පැමිණ සී සෑමෙහි නිරත වන අවස්ථාවේ අසල මාර්ගයේ පිඬු සිඟා වැඩිය බුදුරදුන්, "ආනන්දය, සර්පයා දුටුවා ද" යනුවෙන් අනඳ හිමියන් ඇමතූ ආකාරයත් "දිටිම් ස්වාමීනී" යනුවෙන් පෙරළා අනඳ හිමියන් පැවසූ ආකාරයත් සිහිපත් විය. අනපේක්ෂිත ව මුහුණ දුන් විපත නිසා සිහිවිකල් වන තරමට ම බියපත් ව සිටි හෙතෙම " ආනන්ද සර්පයා දුටුවා ද" "දිටිම් ස්වාමීනී, සර්පයා දිටිම් ස්වාමීනී," යනුවෙන් නිරන්තරයෙන් පුනරුච්චාරණය කරන්නට විය. වික්ෂිප්ත භාවයට පත් රාජ පුරුෂයෝ මොහු රජතුමා හමුවට ඉදිරිපත් කළහ. අනතුරුව බුදුරදුන් හමු වූ රජුට සියලු කරුණු අනාවරණය කර ගැනීමට හැකි විය. ගොවි මහතාට නිදහස ලැබුණි. නොකළ වරදකට හසු වී මරණයට නියම වී සිටි ඔහුට ජීවත් වීමේ භාග්‍යය උදා වූයේ බුදුරජාණන් වහන්සේ උපායශීලී ව ඔහුට පිහිට වූ නිසා ය.

## සෝපාක

සෝපාක කුඩා දරුවෙකි. දිනක් එක් රාත්‍රියක ඔහුට බියකරු අත්දැකීමකට මුහුණ දීමට සිදුවිය. අවට පාළු පරිසරයේ අන්ධකාරය පැතිර ඇත. අමුසොහොනේ තැන තැන දමා ගිය මළ සිරුරුවල කොටස් ආහාරයට ගැනීමට පැමිණ සිටි සතුන්ගේ බියකරු හඬ වරින් වර ඇසේ. සෝපාක මළ මිනියකට බැඳ දමා ඇත. මර බිය, වේදනාව හා කුසගින්න ඔහු ඉතා අසරණ තත්ත්වයට පත් කළේ ය. මෙම අවාසනාවන්ත අත්දැකීමට ඔහුට මුහුණ දීමට සිදු වූයේ තම සුළු පියා නිසාවෙනි.

සෝපාකගේ පියා මිය ගිය පසු මව වෙනත් විවාහයක් සිදු කර ගත්තා ය. එතැන් පටන් සෝපාකට සුළු පියාගේ විවිධ තාඩන පීඩනවලට මුහුණ දෙන්නට සිදු විය. දිනක් ඔහු මල්ලී සමග රණ්ඩුවක් ඇති කර ගත්තේ ය. එහි ප්‍රතිඵලය වූයේ කුරිරු දඬුවමකි. බාප්පා ඔහු රැගෙන ගොස් මෙසේ අමු සොහොනක මළ මිනියකට ගැට ගසන්නේ මරණයට පත් කිරීමේ චේතනාවෙනි. බුදුරජාණන් වහන්සේ මෙම කුඩා දරුවා කෙරෙහි මහා කරුණාවෙන් අමුසොහොනට වැඩම කොට ඔහුට පිහිට වූ සේක. එසේ සිදු නොවන්නට සෝපාක සුසාන භූමියේ ම මිය යාමට බොහෝ විට ඉඩ තිබුණි.

## වියෝ දුකින් උමතු වූ පටාචාරා

පටාචාරා යනු අනපේක්ෂිත අයුරින් විපත් රැසකට මුහුණ දුන් කාන්තාවකි. දෙමාපියන් බැලීමට පැමිණෙන අතර මග ඇයගේ ස්වාමි පුරුෂයා සර්පයකු විසින් දෂ්ට කරන ලදු ව මිය ගියේ ය. සිය දරුවන් දෙදෙනාගෙන් එක් දරුවකු උකුස්සකු විසින් ඩැහැ ගනු ලැබූ අතර අනෙක් දරුවා අචිරවතී ගඟට වැටී මිය ගියේ ය. සැවැත් නුවරට ළඟා වන විට ඇයට දැනගන්නට ලැබුණේ සිය දෙමවුපියන් මෙන් ම සහෝදරයා ද පෙර දින ඇද හැලුණු මහ වැස්සෙන් කඩා වැටුණු නිවසට යට වී මිය ගිය බව ය. අසරණ භාවයේ පතුළට ම වැටුණු ඇයට පියවි සිහිය නැති වී ගියේ ය. උමතු භාවයට පත් ව සිටි ඇයට අවසානයේ පිහිට වූයේ බුදුරජාණන් වහන්සේ ය. පටාචාරා රහත් මෙහෙණියක් වූවා ය.

මීට අමතර ව කිසාගෝතමී, රජ්ජුමාලා වැනි කාන්තාවන්ට මෙන් ම භද්‍රවතිකා ඇතින්න වැනි තිරිසන් සතුනට ද බුදුරජාණන් වහන්සේ පිහිට වූ සේක.

## ගිලනුන්ට උපස්ථාන කිරීම

ගිලනුන්ට උපස්ථාන කිරීම ද අසරණ සරණ වීමකි. එහෙත් ගිලානෝපස්ථානයට සුවිශේෂී අවධානයක් බුදු දහමේ යොමු කෙරෙන බැවින් බුදුරදුන් පිහිට වූ ගිලනුන් පිළිබඳ ව ද කරුණු ඉගෙනීම වැදගත් වේ.

**යෝ භික්ඛවේ මං උපට්ඨහෙය්‍ය**
**සෝ ගිලානං උපට්ඨහෙය්‍ය**
**(මහා වග්ග පාලි)**

යමෙක් මගේ වචන පිළි පැදීමෙන් මට උපස්ථාන කරන්නේ ද
හෙතෙම ගිලනාට උපස්ථාන කරන්නේ ය.

යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.

බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානයේ වටිනාකම ආදර්ශයෙන් ම ලොවට පෙන්නුම් කළ ශාස්තෘවරයෙකි.



පූතිගත්ත තිස්ස හිමි යනු බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවට ලක්ව පිහිට ලද තෙර නමකි. උන් වහන්සේ පෙර භවයක දී කළ අකුසලයක් හේතුවෙන් දරුණු කුෂ්ඨ රෝගයකට ගොදුරු වූහ. ආරම්භයේ දී මුළු ශරීරය පුරා ම කුඩා බිබිළි හටගෙන ක්‍රමයෙන් වර්ධනය වී අවසානයේ විශාල බිබිළි බවට පත් වී ශරීරය එක ම වණයක් බවට පත් විය. පොරොවාගෙන සිටි සිවුර සැරව බිබිළිවල ඇලුණි. උන් වහන්සේ කෙතරම් පිළිකුල් සහගත වූයේ ද යත් උපස්ථාන කරමින් සිටි භික්ෂූන් වහන්සේලා පවා උන් වහන්සේ හැර ගියහ. අවසානයේ ඇප උපස්ථාන කිරීමට කිසිවෙක් ඉදිරිපත් නොවූහ. අලුයම බුදු ඇසින් ලොව දකින බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවට ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසු වූ පූතිගත්ත තිස්ස ස්වාමීන් වහන්සේ යොමු විණි. බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් සමග ගිනිහල් ගෙට වැඩම කොට ඒ රෝගී ස්වාමීන් වහන්සේ උණු පැනින් පූතිගත්ත තිස්ස හිමි නහවා, වණ වී තිබූ සිරුර සියතින් ම පිරිසිදු කොට අලුත් සිවුරු අන්දවා එම අවස්ථාවට අනුව සියලු ඇප උපස්ථාන සිදු කළ සේක. අවසානයේ උන් වහන්සේ ජීවිතයේ අනිත්‍යතාව පැහැදිලි කරමින් තිස්ස හිමියන්ට ධර්මය දේශනා කළ සේක. ධර්මය ඇසීමෙන් තිස්ස හාමුදුරුවෝ රහත් භාවය ලැබ පිරිනිවන් පෑහ.

තවත් එක් භික්ෂු නමක් පිහිටක් නොමැති ව උදරාබාධයකින් පෙළෙමින් සිටි අවස්ථාවක ද බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන් සමග එම භික්ෂු නම නහවා, අවශ්‍ය උපස්ථාන කළහ. එහි දී සියලු භික්ෂූන්ට ගිලානෝපස්ථානයෙහි ඇති වටිනාකම පහදා දුන් සේක.

පුද්ගලයා විවිධ ලෙඩරෝගවලට භාජනය වීම ස්වාභාවික දෙයකි. කිසිවෙකුටත් එය වැළැක්විය නොහැක. වැදගත් වන්නේ එම රෝගයට බඳුන් වූවන්ට අන් අයගෙන් ලැබෙන උපස්ථානයයි. ඕනෑ ම තරාතිරමක කෙනකු රෝගාතුර වූ කල්හි ඔහු අසරණ වීම, තනි වීම සාමාන්‍ය දෙයකි. ගිලානෝපස්ථානයේ වැදගත්කම පෙන්වා දීමේ දී උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග ද බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළහ.

## උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග

1. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම
2. රෝගියාට හිතකර හා අහිතකර ආහාර පාන දැන ඒ අනුව කටයුතු කිරීම
3. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොර ව කරුණාවෙන් කටයුතු කිරීම
4. මල මූත්‍ර ආදිය කෙරෙහි පිළිකුල් නූපදවීම
5. රෝගියාගේ සිත සැනසෙන කථා පැවසීම

මෙම ගුණාංග බුද්ධ චරිතය තුළ ද මනා ව පිළිබිඹු වෙයි.

අප අවට සමාජයේ ද අසරණ භාවයට හා ගිලන් බවට පත් වූවෝ බොහෝ වෙති. ඇතැමෙක් අපගේ නෑදෑ හිතවත්තු ය. ඇතැමෙක් අපට දුරස්ථ වූවෝ ය. ඔවුන් සමාජයෙන් කොන් නොකොට රැක බලා ගැනීමට අප කුඩා කල සිට හුරු පුරුදු විය යුතු ය. එය අප සැමගේ යුතුකමක් මෙන් ම වගකීමක් ද වෙයි. බුදු සිරිත අනුව කටයුතු කරන්නේ නම් සමාජය තුළ අසරණ භාවයට පත් වන්නන් බොහෝ දුරට අඩු වනු ඇත. අසරණයින්ට හා රෝගීන්ට පිහිට වීම සඳහා අපට අනුගමනය කළ හැකි බොහෝ දේ ඇත. වයසට ගොස් සිටින අපේ ම සීයාට, අත්තම්මාට ඒ අයගේ කටයුතු කර ගැනීමට අපට උපකාර කළ හැකි ය. බස් රථයට ගොඩවීමට අපහසු ව සිටින අයකුට කාරුණික ව උදවු කළ හැකි ය. අපේ ම පවුලේ සාමාජිකයකු ගිලන් වූ විට ආදරයෙන් සැලකිය හැකි අතර, තමන්ගේ උපන් දිනය වෙනුවෙන් කාට හෝ අසරණ කෙනෙකුට යම් උපකාරයක් කරන ලෙස දෙමාපියන්ගෙන්

ඉල්ලා සිටීමට පුළුවන. වටපිටාවේ අසරණ සතුන් සඳහා ජල බඳුනක්, ආහාර බඳුනක් තැබිය හැකි නම් එය ඉතා යහපත් ක්‍රියාවකි. පන්ති කාමරයේ සිටින විෂය කරුණු අවබෝධ කර ගැනීමට අසීරු සොයුරු සොයුරියනට අප උදවු කිරීම ද අසරණ සරණ වීමකි.



## සාරාංශය

අසරණ වීම හා ලෙඩ වීම ලොව සැමට පොදු ධර්මතාවකි. අසරණයින්ට පිහිට වීම උසස් මානුෂික ගුණාංගයකි. මෙම උසස් ගුණාංගයට නිදසුන් රැසක් බුදු සිරිත ඇසුරින් ඉදිරිපත් කළ හැකි ය. අසරණ වූ මහලු පියා, සෝපාක, පටාචාරා, කිසාගෝතමී, කුඹුරක සීසාමින් සිටි ගොවියා, පූතිගත්ත තිස්ස හිමි ඒ අතර කිහිප දෙනෙකි. කුඩා කල සිට අසරණයින්ට උපකාර කිරීමට පාසල් සිසුන් වශයෙන් අප හුරු පුරුදු විය යුතු ය.



## ක්‍රියාකාරකම

1. බුදුරජාණන් වහන්සේ පිහිට වූ අසරණයින් තිදෙනෙකුගේ නම් ලියන්න.

2. අසරණ සරණ ගුණය විදහා දක්වෙන කතාවක් ගොඩ නගන්න.

3. පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට අසරණයින්ට පිහිට විය හැකි අවස්ථා තුනක් ලියන්න.